# ඕලු, නෙළුම්, මානෙල්



## පුංචි ඉඩක වැවෙන සුගන්ධවත් ජලජ පුෂ්ප



අනාදිමත් කාලයක සිට අප රටේ ජලජ ශාක වශයෙන් ප්‍රධාන කොට සැළකුවේ ඕලු, නෙළුම්, මානෙල් යන විශේෂ වර්ග 3 වය.

ජලජ ශාක යනු , ඇසූ පමණින් ගතට සිතට සුවයක් ලැබෙන දුටු සැනින් නෙත සිත ඇදගන්නා වර්ණවත් මල් පිපෙන විවිධ වර්ගයේ පැලෑටි විශාල ප්‍රමාණයකට උරුමකම් කියන ශාක විශේෂයකි.

මෙහිලා දක්නට ලැබෙන විශේෂ ගුණාංග කිහිපයකි. ජලජ ශාකයන් වැඩෙන ස්ථානයක් වන්නේ වගුරු බිම්, ගංගා, වැව්, පොකුණු එළිමහන් තෙත් ප්‍රදේශයන්ය. මෙහිදි තවත් එක් විශේෂ කරුණක් නම් ජලය මතුපිට සහ ජලය ඇතුලත ශාක බොහෝ සේ වර්ධනය වී වැඩීමයි. මේ කොටස් දෙක අතුරින් ජලය මතුපිට වැවෙන ශාකවල මල් හටගැනීම ඉතාම අලංකාරවත් ලෙස සිදුවේ. මෙම ශාකයන් අතරින් ජලය ඇතුලත සහ ජලය මතුපිටද යන ස්ථානයන් දෙකෙහිම ඉතා හොඳින් වැඩීමේ හැකියාවද සමහර ජලජ පැලෑටි වල විශේෂ ලක්ෂණයක් හැටියට දැකිය හැකිය.

තවත් විශේෂ කරුණක් නම් මෙම ශාක විශේෂයන්ගෙන් කොටසක් ජලාශ්‍රිත සතුන් ආහාර ලෙස ගන්නා අතර, මිනිසුන්වද ආහාරයට ගැනීමට හැකිවීමය. කෙකටිය, ඕළු, නෙළුම්, යන මල් වර්ග වල ඇට , අල, දඬු, ආහාර වශයෙන් ගත හැකිය. තවත් කුඩා ජලජ ශාක මේ අතර වේ. ජාතික පුෂ්පය වූ නිල් මානෙල් ද වැටෙන්නේ මේ ගණයටයි.

### නෙලුම්:-

ප්‍රධාන වශයෙන් නෙලුම් ශාකය ගැන සඳහන් කිරීමේදී අප රටට ආවේනික වූ නෙලුම් ශාකය ගැඹුරු මඩ සහිත හොඳින් හිරු එළිය වැටෙන ස්ථානවල ද ඉතා පහසුවෙන් අලංකාරවත්ව විශාල පත්‍ර සහිතව වැඩේ. මේවායේ හට ගන්නා මල් තද රෝස පැහැයෙන් සහ සුදු පැහැයෙන් යුක්ත වන අතර, හොඳින් වැඩුණු නෙලුම් මලක් අඟල් 8 ක් පමණ පලලින් යුතුවේ. මින් ප්‍රසන්න සුවඳක් විහිදේ. මල වියලි පෙති හැලුණු පසු එහි ඇති බීජ හොඳින් මෝරා වියලුණු පසු කළු පැහැයක් ගන්නා අතර, එම බීජ වලින් නැවත පැල බෝකර ගැනීම සිදුකළ හැක. තවද එහි ඇති අල මගින් ද පැල බෝ කර ගැනීමේ හැකියාව ඇත. අප රටේ වියළි ප්‍රදේශවල පිහිටි තෙත් බිම්වල ඉතා හොඳින් මෙම ශාකය වැඩේ.

